අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, අගෝස්තු 2013

General Certificate Education (Adv.Level) Examination, August 2013

# ආර්ථික විද්‍යාව I / II - ආදර්ශ විසඳුම්

## ආර්ථික විද්‍යාව I ආදර්ශ විසඳුම් - 2013
## (I කොටස)

| | | | |
|---|---|---|---|
| 01. 5 | 02. 1 | 03. 2 | 04. 3 |
| 05. 5 | 06. 5 | 07. 5 | 08. 4 |
| 09. 5 | 10. 2 | 11. 4 | 12. 2 |
| 13. 1 | 14. 1 | 15. 3 | 16. 3 |
| 17. 2 | 18. 2 | 19. 5 | 20. 5 |
| 21. 4 | 22. 4 | 23. 5 | 24. 1 |
| 25. 2 | 26. 3 | 27. 4 | 28. 3 |
| 29. 5 | 30. 3 | 31. 4 | 32. 1 |
| 33. 1 | 34. 2 | 35. 2 | 36. 3 |
| 37. 5 | 38. 3 | 39. 3 | 40. 4 |
| 41. 4 | 42. 2 | 43. 2 | 44. 2 |
| 45. 1 | 46. 2 | 47. 1 | 48. 2 |
| 49. 1 | 50. 2 | | |

WWW.KLCCOMMERCE.COM

## (II කොටස)

### "අ" උප කොටස

1. (i) නිෂ්පාදනය සඳහා ඉවහල් වන මූර්ත වත්කම් ප්‍රාග්ධනය (Capital) වේ. නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන සාධකයක් වේ. මිනිසා විසින් මේ මූර්ත වත්කම් නිර්මාණය කර තිබීම විශේෂ ලක්ෂණයක් වේ.

උදළු, කැති, පොරෝ ආදී මෙවලම් සහ උපකරණත්, පරිගණක, විදුලි බලාගාර ආදී යන්ත්‍ර සහ යන්ත්‍රාගාරත්, මෝටර් රථ, දුම්රිය ආදී ප්‍රවාහන මාධ්‍යත්, අමුද්‍රව්‍ය තොග යනාදියත්, ළිං, වැව් ආදී ජල සම්පාදන ක්‍රමත් නිදසුන් වේ.

මානව ප්‍රාග්ධනය යනු කිසියම් පුද්ගලයකු විසින් අධ්‍යාපනය, පුහුණුව හා අත්දැකීම් මගින් අත් කරගනු ලැබූ නිපුණතා, දැනුම, සමාජීය හා පෞරුෂත්ව ගුණාංග සම්භාරය යි.

එනම් මානව ප්‍රාග්ධනය යනු අධ්‍යාපනය හා පුහුණුව මගින් මිනිසා තුළ කරනු ලබන ආයෝජනයකි. මානව ප්‍රාග්ධනය වැදගත් වන්නේ,

- ★ පුහුණුව මගින් නිෂ්පාදනයේ ගුණාත්මක බව හා ඵලදායිතාව වර්ධනය කිරීමට හැකි වීම හා දැනුම කුසලතා, ආකල්ප වෙනස් කිරීම මගින් ශ්‍රමයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම යි.

  මානව ප්‍රාග්ධනය, භෞතික ප්‍රාග්ධනය මෙන් ස්පර්ශ කළ හැකි වත්කමක් නොවන අතර එය සජීවී වේ. නමුත් ප්‍රාග්ධනය අජීවී වේ.

  ශ්‍රමය හා ප්‍රාග්ධනය යන සාධක දෙකෙහි ම ඇතැම් ගුණාංග මානව ප්‍රාග්ධනය තුළ මිශ්‍ර ව ඇත.

  එසේ ම මානව ප්‍රාග්ධනය තුළ කරනු ලබන ආයෝජනය අදාළ පුද්ගලයාට පමණක් සුවිශේෂිතාව පවතියි.

(ලකුණු 04)

(ii) ශ්‍රම විභජනය යනු භාණ්ඩයක නිෂ්පාදන ක්‍රියාවලිය එකම පුද්ගලයකු විසින් ඉටු කිරීම වෙනුවට නිෂ්පාදන ක්‍රියාවලිය කොටස්වලට වෙන් කර, එක් එක් කටයුත්ත සඳහා වෙන් වෙන් වශයෙන් ශ්‍රමිකයන් යෙදවීමේ ක්‍රියාවලිය යි.

විශේෂීකරණය යනු ශ්‍රම විභජනයේ ප්‍රතිඵලයක් ලෙස එකම කාර්යය එක දිගට ම කරගෙන යාමෙන් පුද්ගලයා හෝ ආයතනයක් ලබන විශේෂ හැකියාව නිපුණතාව වේ. මෙය විශේෂ ප්‍රාගුණ්‍යය ලෙස ද හැඳින්වේ.

විශේෂීකරණ හා ශ්‍රම විභජනය තංවාලීම සඳහා මුදල් උපකාරී වන්නේ,

විශේෂ ප්‍රාගුණ්‍යය හා ශ්‍රම විභජනය සමග වෙළෙඳාම ද එකිනෙකට බැඳී පවතියි. කිසියම් එක් සාධකයක් හෝ සේවාවක් හෝ පමණක් නිෂ්පාදනයෙහි යෙදී සිටින පුද්ගලයෙකුට තමන්ට අවශ්‍ය කරන අවශේෂ භාණ්ඩ ලබා ගැනීමට තම නිෂ්පාදනයෙන් වැඩි කොටසක් වෙළෙඳාම් කරගත යුතු යි.

- ★ අතීතයේ දී මෙම වෙළඳාම සිදු වූයේ භාණ්ඩයකට භාණ්ඩයක් ලෙස සෘජු හුවමාරු ක්‍රමයකට ය.

  එහෙත් එය අතිශයින් දුෂ්කර හා වියදම් අධික ක්‍රමයක් වූ අතර වුවමනා පිළිබඳ ද්විත්ව සමපාතයක් ඇති කරගැනීමේ ගැටලු ව නිසා විශේෂ ප්‍රාගුණ්‍යයට ඇති ඉඩකඩ ද බෙහෙවින් සීමා විය.

- ★ භාණ්ඩ හුවමාරු ක්‍රමය යටතේ පැනනැඟුණු දුෂ්කරතාවන් ඉවත් කර ගැනීම සඳහා මුදලේ භාවිතය ඉවහල් වූයේ ය. වී ගොවිතැන් කරන ගොවියෙකුට රෙදි අවශ්‍ය වූයේ නම්, දැන් ඔහු තම වී නිෂ්පාදනයේ අතිරික්තයෙන් කොටසක් මුදලට හුවමාරු කොට එම මුදල් යොදා රෙදි හා වෙනත් භාණ්ඩ පහසුවෙන් මිල දී ගනී.

- ★ බඩු හුවමාරු ක්‍රමයේ පැවති දුෂ්කරතා ඉවත් කිරීම මගින් මුදල් වෙළෙඳාමට හා විශේෂ ප්‍රාගුණ්‍යය පුළුල් වීමට විශාල ඉඩක් සලසා ඇත.

- ★ මුදල් ආර්ථික ක්‍රමයක පුද්ගලයෝ තමන්ට වඩාත් නිපුණතාව හා හැකියාව ඇති අංශ විශේෂ ප්‍රාගුණ්‍යය සඳහා තෝරා ගනිති; එමගින් තමන්ගේ අවශ්‍යතාවන්ට වඩා වැඩි අතිරික්ත නිෂ්පාදනයක් වෙළඳපොළ සඳහා බිහි කරති. ඔවුහු මෙම වෙළඳපොළ අතිරික්තය මුදලට පෙරළා ගෙන තමන්ට අවශ්‍ය සෙසු භාණ්ඩ මිල දී ගනිති.

- ★ ශ්‍රම විභජනය වැනි සංකීර්ණ ක්‍රියාවලියන් සාර්ථක වනුයේ විශාල වෙළෙඳපොළක් පවතින විට දී ය. මුදල් භාවිතය නිසා හුවමාරු ව කාර්යක්ෂම වීම කරණ කොට විශාල වෙළෙඳපොළක් ඒ සඳහා විවෘත කරගැනීමට හැකියාව ලැබේ.

(iii) වෙළෙඳපළ ආර්ථික පද්ධතිය.

- ★ සම්පත් පිළිබඳ පෞද්ගලික අයිතිය, වෙළෙඳපොළ හා මිල යන්ත්‍රණය මගින් සිදු වන සම්බන්ධීකරණය තුළින් ආර්ථික මෙහෙයවයි.

- ★ එම ක්‍රමය තුළ ආර්ථික කටයුතුවලට සහභාගී වන සෑම ඒකකයක් ම තම තමන්ගේ ස්වර්ථය උදෙසා වෙහෙසෙන අතර සෑම පුද්ගලයෙක් හා ආයතනයක් ම තෘප්තිය හෝ ලාභය උපරිම වන ආකාරයට නිෂ්පාදන තීරණ ගනියි. එනම් එම තීරණ ගන්නා ව්‍යවසායකයා පෞද්ගලික ව්‍යවසායකයෙකි.

- ★ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය තම තමන්ගේ අභිමතය පරිදි සිදු වේ. භාණ්ඩ හා සේවා මිල දී ගන්නන් හා සපයන්නන් එකිනෙකට ස්වාධීන ව කටයුතු කරන අතර ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි විවිධත්වයක් පවතියි.

www.SamithAlwis.wordpress.com

* පෞද්ගලික දේපළ ආරක්ෂා කිරීමට සහ වෙළෙඳපොළ කාර්යක්ෂමව ක්‍රියාත්මක වීමට අවශ්‍ය හිතකර වාතාවරණය සැපැයීමට ආණ්ඩුවේ කාර්ය භාරය සීමා සහිත වේ.
* පාරිභෝගික ස්වාධිපත්‍යයක් ඇතැයි යන විශ්වාසයෙන් කටයුතු කරන අතර දැඩි තරගකාරීත්වයක් දැක ගත හැකි යි.

නැතහොත්

* මූලික ආර්ථික ප්‍රශ්න වන කුමක්, කොපමණ, කා සඳහා නිෂ්පාදනය කරනවා ද යන කරුණු මිල යාන්ත්‍රණය මගින් විසඳා ගැනේ. ලාභයක් සහිත ව නිපදවිය හැකි භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන අතර, පාඩුවක් හට ගන්නා භාණ්ඩ නිෂ්පාදනය නොකෙරේ. භාණ්ඩ හා සාධක වෙළෙඳපළින් ලැබෙන මිල සංඥාවන් පදනම් කරගනිමින් අදාළ තීරණ ගනු ලැබේ.
* වෙළෙඳපළ ක්‍රමය තුළ නිෂ්පාදකයෝ පවත්නා තාක්ෂණය හා සාධක මිල අනුව වඩාත් කර්යක්ෂම ව නිෂ්පාදන ශිල්ප ක්‍රම තෝරා ගනිති.
* පෞද්ගලික ආදායම් තීරණය වනුයේ පුද්ගලයන් සතු ඵලදායී සම්පත් ප්‍රමාණය හා ඒවාට සාධක වෙළෙඳපොළේ ලැබෙන මිල ගණන් අනුව ය. සාධක මිල තීරණය වන්නේ සාධක වෙළෙඳපොළේ ඉල්ලුම හා සැපයුම මත ය.

විධානගත ආර්ථික පද්ධතිය

* මෙම ක්‍රමය තුළ සියලු ම සම්පත් රජය හිමි කර ගනු ලබන අතර ආර්ථික තීරණ ගැනීම සිදු වනුයේ රජය මගින් පත් කරන ලද මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගිනි. සම්පත් භාවිතා කෙරෙන ආකාරය, නිමැවුමේ සංයුතිය හා බෙදාහැරීම, නිෂ්පාදය සංවිධානය කිරීම ආදී සියලු තීරණ ගනු ලබන්නේ රජය මගින් පත් කරන ලද මධ්‍යගත සැලසුම් අධිකාරයක් විසිනි.
* සියලු ම නිෂ්පාදන ආයතන රජය සතු වන අතර ඒවා නිෂ්පාදනය කරනු ලබන්නේ රජයේ ලබාදෙන නියෝග මගිනි. එනම් රාජ්‍ය ව්‍යවසායකය යි.
* එක් එක් නිෂ්පාදන ආයතනයේ නිමැවුම් ඉලක්ක, සහ ඒවා සාක්ෂාත් කර ගැනීමට ඒ ඒ ආයතනයට වෙන් කරනු ලබන සම්පත් ප්‍රමාණය තීරණය කරන්නේ ද මධ්‍යගත සැලසුම් මණ්ඩලය මගිනි.
* නිමැවුම, ප්‍රාග්ධන භාණ්ඩ හා පාරිභෝජන භාණ්ඩ අතර බෙදා වෙන් කරනු ලබන ආකාරයත්, කර්මාන්ත අතර ප්‍රාග්ධන භාණ්ඩ බෙදා වෙන් කෙරෙන ආකාරයත්, තීරණය කරනුයේ ද මධ්‍යම සැලසුම් මණ්ඩලයේ දිගුකාලීන ආර්ථික ප්‍රමුඛතා මත ය.

නැතහොත්

* විධානගත ආර්ථිකයක සම්පත් බෙදීයාම සිදුවනුයේ මධ්‍යම සැලසුම් අධිකාරිය විසින් ලබාදෙන නියෝග මගිනි. මෙහි දී ඔවුන් භාණ්ඩවල මිල නියම කරනු ලබන අතර එම පාලන මිලේ දී කොපමණ මිල දී ගන්නවා ද යන්න පාරිභෝගිකයෝ තීරණය ගනිති.
* නිෂ්පාදන ක්‍රම ශිල්ප තෝරීම කරනු ලබන්නේ ද මධ්‍යම සැලසුම් අධිකාරිය විසිනි.
* නිමැවුම හා ආදායම් බෙදීයාම ද මූලික වශයෙන් සැලසුම් අධිකාරිය තීරණය කරයි. අවම වැටුප් අනුපාතික සහ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ද තීරණය කරනුයේ සැලසුම් අධිකාරිය යි.

(iv) ආර්ථික කාර්යක්ෂමතාව යනු සමාජය සතු සීමිත සම්පත් භාවිතා කොට නිපදවාගත හැකි සමාජය වඩාත් කැමති භාණ්ඩ හා සේවා අතුරෙන් උපරිම ප්‍රමාණය නිපදවා ගැනීම යි. ආර්ථික කාර්යක්ෂමතාව සඳහා කාර්යක්ෂමතාවන් දෙකක් කොන්දෙසි දෙකක් එකවිට අත් කර ගැනීම අවශ්‍ය වේ.

1. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව ය.
2. සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව ය.

නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් කරන්නේ අවම නිෂ්පාදන පිරිවැයක් යටතේ අදාළ භාණ්ඩ හා සේවා සංයෝජනය නිෂ්පාදනය කිරීම ය. එනම් දෙන ලද යෙදවුම් ප්‍රමාණයකින් උපරිම නිමැවුමක් ලබා ගැනීම හෝ දෙන ලද නිමැවුමක් අවම යෙදවුම් ප්‍රමාණයකින් නිපදවීම හෝ මින් අදහස් වේ.

නිෂ්පාදන කාර්යක්ෂමතාව සඳහා අවශ්‍යතා දෙකක් සපුරාලිය යුතු ය.

1. පූර්ණ සේවා නියුක්තිය.
2. පූර්ණ නිෂ්පාදනය          එම අවශ්‍යතාවන් ය.

සම්පත් බෙදා වෙන් කිරිමේ කාර්යක්ෂමතාව යනු සමාජයට වඩාත් අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා සමාජය සතු සීමා සහිත සම්පත් යොදාගැනීම යි.

මෙම අවශ්‍යතාව සපුරාගැනීම සඳහා සෑම භාණ්ඩයකම ආන්තික පිරිවැය එහි ආන්තික ප්‍රතිලාභයට සමාන විය යුතු ය. එනම් $MC = P$ වශයෙනි.

(v) සූක්ෂ්ම ආර්ථික විද්‍යාව යනු ආර්ථික පද්ධතිය තුළ සිටින පාරිභෝගිකයන්, ශ්‍රමිකයන්, නිෂ්පාදන ආයතන හා ආණ්ඩුව වැනි තීරණ ගන්නා විවිධ ඒකකයන්හි හැසිරීම විග්‍රහ කිරීමය. එකී ඒකක විකල්ප හමුවේ තේරීම් කරන ආකාරයත්, එම තේරීම් නිසා ඇතිවන ප්‍රතිඵලයත් මෙහි දී විශ්ලේෂණය කෙරේ. වෙළෙඳපළ නිෂ්පාදන ආයතන හා කුටුම්භ යන ඒකකයන්හි හැසිරීම මෙහි දී ප්‍රධාන වශයෙන් අධ්‍යයනයට පාත්‍ර වේ.

සාර්ව ආර්ථික විද්‍යාව යනු කිසියම් ආර්ථික පද්ධතියක් සමස්තයක් වශයෙන් ගෙන එහි ව්‍යූහය, සාධනය හා හැසිරීම පිළිබඳ ව විශ්ලේෂණය කිරීම යි. සමස්ත නිමැවුම් මට්ටම, උත්පාත හා අවපාත, උද්ධමනය, විරැකියාව මට්ටම, ගෙවුම් ශේෂය, විනිමය අනුපාතිය යනාදී පිළිබඳ ව සාකච්ඡා කිරීම මෙහි දී සිදු වේ.

සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක භාවිත
* හිඟකම
* තේරීම
* තේරීම නිසා හට ගන්නා ආවස්ථික පිරිවැය
* තාක්ෂණ වෙනස් වීම නිසා හට ගන්නා ප්‍රතිඵල
* විකල්ප ප්‍රයෝජන

සාර්ව ආර්ථික විද්‍යාත්මක භාවිත
* පූර්ණ සේවා නියුක්තිය සහ ඌන සේවා නියුක්තිය
* ආර්ථික වෘද්ධිය
* ආර්ථික පසුබෑසීම හා අවපාතය
* ආර්ථික බිඳ වැටීම

02. (i) සංඥා සැපයීමෙහිලා කාර්යය (තොරතුරු සැපයීමේ කාර්යය)

වෙළෙඳපොළ ක්‍රමය තුළ පාරිභෝගිකයන්ට, නිෂ්පාදකයන්ට, නිෂ්පාදන සම්පත් හිමියන්ට කුමක් කොපමණ ප්‍රමාණයකින් මිල දී ගන්නවා ද සපයනවා ද යන්න තීරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය සාපේක්ෂ මිලයන් පිළිබඳ තොරතුරු සැපයීම මින් අදහස් කෙරේ. වැරදි හෝ නොමඟ යවනසුලු තොරතුරු මිල සංඥා මගින් ලබා දුන හොත් වෙළෙඳපළ ක්‍රියාකාරීත්වය අකාර්යක්ෂම වන අතර, එය වෙළෙඳපොළ අසමත් වීමට තුඩු දේ.

www.SamithAlwis.wordpress.com